# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 17 දරන ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2007** මැයි මස **08** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 මැයි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. 8.25 යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

# 2007 අංක 17 දරන ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම(සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 මැයි මස 08 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී.) 17/2005

## ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සමිතියක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟවන ලද රීතිවලට අනුව, එකී පදනම හා සම්බන්ධ සියලු කාරණා ඵලදායි ලෙස කරගෙන යාමේ සහ ඉටුකර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා උදෙසා ද, ඒ පරමාර්ථ හා කාරණා කිහිපය එකී පදනම විසින් මෙතෙක් කල්, සාර්ථක ලෙස කරගෙන ගොස් හා ඉටුකර ඇති හෙයින් ද, ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලීම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මෙම පනත 2007 අංක 17 දරන ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ලියෝ සහ ජොසපින් ද අල්මේදා අනුස්මරණ පදනම සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) අසරණ හෝ දිළිඳු වැඩිහිටියන්ට ආරක්ෂාව සැලසීම සඳහා වැඩිහිටි නිවාස පිහිටුවීම සහ ඔවුන්ගේ ශාරීරික, මානසික

සහ බුද්ධිමය අවශ්‍යතා සපුරාලීම මෙන්ම සමාජ, ආගමික හා විනෝදාශ්වාද කටයුතුවලට සහභාගි වීමට ඔවුන්ට අවස්ථා සලසා දීම ;

(ආ) වැඩිහිටි හා අවතැන් වූ තැනැත්තන් සඳහා නිවාස සැපයීම සහ අසනීප වූ, ගිලන් වූ සහ ආබාධිත වූ තැනැත්තන් සඳහා රෝහල් පවත්වාගෙන යාම ;

(ඇ) අසරණ පුද්ගලයන්ට අධ්‍යාපනික සේවා හා වෘත්තීය පුහුණුව ලබා දීම ;

(ඈ) හැකිතාක් දුරට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීම සඳහා ආබාධිත පුද්ගලයන්ට උපකාර කිරීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම සහ නඩත්තු කිරීම ;

(ඉ) වෙනත් ආකාරවලින් අධ්‍යාපනික, සමාජීය සහ වෙනත් පුණ්‍ය සේවා සැපයීම ;

(ඊ) ශිෂ්‍යයින් සඳහා පොත් බැහැර දීමේ හා විමර්ශනය කිරීමේ පහසුකම් සහිතව පුස්තකාල පිහිටුවීම හා පවත්වාගෙන යාම සහ වැඩිහිටි ජනයා අතර කියවීමේ පුරුද්ද වර්ධනය කිරීම ;

(උ) පොදු විභාගවල දී සාර්ථක ප්‍රතිඵල ලබාගන්නා දිළිඳු සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ;

(ඌ) දිළිඳු අනාථයන්ට සහ ගිලනුන්ට වෛද්‍ය පහසුකම්, ඇඳුම් සහ ඉඳුම් හිටුම් ලබාදීම ;

(එ) දෘශ්‍යාබාධිත, කායික වශයෙන් ආබාධිත, මානසික ආබාධවලින් පෙළෙන සහ ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයන්ට සුභ සාධන පහසුකම් සැලසීම ;

(ඒ) ප්‍රජාවේ සමාජ-ආර්ථික, ආගමික සහ සංස්කෘතික අවශ්‍යතා හඳුනාගැනීම සහ එවැනි අවශ්‍යතා සපුරාලීම සඳහා යෝග්‍ය ව්‍යාපෘති හා වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ප්‍රජාවේ පොදු සුභ සාධනයට උපකාරීවන වෙනත් කවර හෝ ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීම ;

(ඔ) සංස්ථාවේ අරමුණු වැඩි දියුණු කිරීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, පන්ති හා සමුළු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ සියලු මහජන කොටස් හා ජනතාව අතර සාමය, හොඳහිත, අවබෝධය හා සහයෝගිත්වය ප්‍රවර්ධනය කිරීම ;

(ක) ආර්ථික වශයෙන් හා සාමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයේ සිටින තරුණ තරුණියන් නගා සිටුවීම ප්‍රවර්ධනය කිරීම;

(ග) අධ්‍යාපනය හා දැනුම ප්‍රවර්ධනය කිරීම හා දියුණු කිරීම සහ උගතුන්ට, පර්යේෂකයන්ට සහ පිළිගත් ආයතන හෝ සංවිධානවලට ශිෂ්‍යත්ව, ප්‍රදානයන් හෝ වෙනත් ආකාරයෙන් මූල්‍ය ආධාර ලබාදීම ;

(ච) සංස්කෘතික, සාහිත්‍ය සහ පුණ්‍ය කටයුතු ප්‍රවර්ධනය හා දිරිගැන්වීම ;

(ජ) යෞවනයන්ගේ දැනුම වර්ධනය කිරීම සහ ඔවුන්ට රැකියා ලබා ගැනීමට උපකාරීවීම අරමුණු කර ගෙන පොදු දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු, විවාද සහ කෙටිකාලීන අධ්‍යාපනික පාඨමාලා සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ට) ජාතික සහ ජාත්‍යන්තර වැදගත්කමක් ඇති කරුණු පිළිබඳ ප්‍රකාශන ප්‍රවර්ධනය කිරීම හා දිරිගැන්වීම; සහ

(ඩ) අධ්‍යාපනික ආයතන, පුස්තකාල, කෞතුකාගාර සහ රෝහල් පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

සංස්ථාවේ රීති.

4. සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන කළමනාකරණ කමිටුවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය. මේ

පනතේ විධිවිධානවලට යටත්ව, කළමනාකරණ කමිටුව විසින් පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය :—

(අ) සංස්ථාවේ නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ පාරිශ්‍රමිකයන් ඇතුළු සේවා නියම හා කොන්දේසි ;

(ආ) සංස්ථාවේ නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රම හා පරිපාටි;

(ඇ) වාර්ෂික වැඩසටහන සහ වැඩ සැලැස්ම, වාර්ෂික අයවැය, සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් සහ එබඳු වැඩ සටහන්, වැඩ සැලසුම්, අයවැය, වාර්තා සහ ගිණුම් සකස් කළ යුතු ආකාරය ; සහ

(ඈ) මේ පනත මගින් රීති සකස් කරනු ලැබිය යුතු හා අධිකාරී බලය ලබා දිය යුතු වෙනත් එබඳු කරුණු.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**5**. මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් චංචල හෝ නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම හෝ දැරීම සහ එබඳු දේපළකට අදාළ යම් භාරයකට යටත්ව එබඳු දේපළ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි එබඳු සියලුම ගිවිසුම්වලට එළඹීම සහ ඒවා ඉටු කිරීම;

(ඇ) දේශීය හෝ විදේශීය පුද්ගලයන්ගෙන් සහ සංවිධානවලින් ත්‍යාගයන්, ප්‍රදානයන් හෝ පරිත්‍යාගයන් මුදලින් හෝ ද්‍රව්‍යවලින් භාර ගැනීම හෝ එකතු කිරීම ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ හුවමාරු කළ හැකි වෙනත් ලේඛන සෑදීම, ලිවීම, ප්‍රතිග්‍රහණය, අනුමත

කිරීම, හුවමාරු කිරීම, මිල දී ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ ඕනෑ ම බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ සහ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඉ) සිය අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය වන මුදල් ඇපකර ඇතිව හෝ නැතිව ණයට ගැනීම ;

(ඊ) කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අදාළ කර නොගත් ආදායම් කිසිවක් ඇතුළුව සංස්ථාවට අයත්වන්නා වූ මුදල් කිසිවක් ආයෝජනය කිරීම ;

(උ) සිය අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධාරීන් හා සේවකයන් පත් කිරීම ; සහ

(ඌ) සංස්ථාවේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ සියලු ම කටයුතු සම්බන්ධයෙන් රීති සෑදීම සහ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන ආකාරයෙන් එබඳු රීති සෑදීම සහ ඒවා වෙනස් කිරීම, සුදුසු පරිදි සකස් කිරීම සහ අවලංගු කිරීම.

**6**. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් කියනු ලබන සහ සඳහන් කරනු ලබන) ස්වකීය වූ අරමුදලක් සංස්ථාවට තිබිය යුත්තේ ය. සංස්ථාවේ අරමුදල.

(2) පහත දැක්වෙන මුදල් අරමුදලට බැර කළ යුත්තේ ය :—

(අ) මේ පනත යටතේ සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ ක්‍රියාවේ යෙදවීමේ දී සංස්ථාවට ලැබිය හැකි සියලු ම මුදල් ; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ මූලයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානයන් වශයෙන් සංස්ථාවට ලැබිය හැකි සියලු ම මුදල්.

(3) සංස්ථාවේ අරමුදලින් පහත සඳහන් වියදම් පියවිය යුත්තේ ය :—

(අ) මේ පනත යටතේ සිය බලතල, කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී, ක්‍රියාවේ යෙදවීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන සියලු ම මුදල් ; සහ

(ආ) මේ පනත ප්‍රකාරව හෝ ඒ යටතේ එබඳු අරමුදල්වලින් ගෙවිය යුතු එවැනි සියලු ම මුදල්.

කළමනාකරණ කමිටුව විධිමත් පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු බව.

7. (1) සංස්ථාවේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ම ගණුදෙනු පිළිබඳ ගිණුම් පොත් නිසි පරිදි පවත්වාගෙන යාමට කළමනාකරණ කමිටුව කටයුතු කළ යුත්තේ ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය විය යුත්තේ ලිත් වර්ෂය ය.

(3) සංස්ථාවේ ගිණුම්, සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (8) වන වගන්තියේ අර්ථානුකූලව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

8. සංස්ථාවේ මුද්‍රාව, -

(අ) කළමනාකරණ කමිටුව විසින් වරින් වර නිගමනය කරනු ලැබිය හැකි පුද්ගලයින් භාරයේ තිබිය යුත්තේ ය;

(ආ) කළමනාකරණ කමිටු විසින් නිගමනය කරනු ලැබිය හැකි ආකාරයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී කළමනාකරණ කමිටුවේ අනුමැතිය ඇතිව මිස කවර හෝ ලේඛනයකට වුව ද නොතැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

9. සංස්ථාව විසුරුවා හරින ලද විටක, සංස්ථාවේ සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර වුව ද දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය ආදායම හෝ දේපළ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදාදීම එහි රීති මගින් තහනම් කොට ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේදැයි සංස්ථාවේ සාමාජිකයන් විසින් සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය.

**10**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.